රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 226

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1983 ඔක්:.එස 5 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## නිලධරයන්ගේ/සේවකයන්ගේ උපන් දින සනාථ කිරීම.

අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකුගේ/සේවකයකුගේ උපන් දිනය කොයියම් කරුණක් සඳහා වුවද සනාථ කර ගැනීමේදී, රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ ඔහු නිසි පරිදි බලය පවරා ඇති නිලධරයකු හෝ නිකුත්කර ඇති උප්පැන්න සහතිකයක් හෝ 1959.03.05 වැනි දින හා අංක 482 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 වැනි ඡේදයේ සඳහන් වයස පිළිබඳ විශේෂ සහතිකයක් හෝ මිස වෙනත් කිසිම ලියවිල්ලක් පිළිනොගතයුතුය.

02. යම් උප්පැන්න සහතිකයක හෝ අනුමාන වයස් සහතිකයක හෝ සත්‍යාසත්‍යතාව ගැන යම් සැකයක් ඇති වුවහොත් එහි නිරවද්‍යතාව දැනගැනීම සඳහා සහතිකය නිකුත් කළ බලධරයා වෙත එය යොමු කළ යුතුය.

03. උප්පැන්න සහතිකයක් හෝ අනුමාන වයස් සහතිකයක් හෝ හැර වෙනත් ලියවිල්ලක් පදනම් කර ගෙන යම්කිසි නිලධරයකුගේ/සේවකයකුගේ වයස දැනටමත් නිගමනය කර තිබේනම්, එම නිලධරයාගේ/සේවකයාගේ උප්පැන්න සහතිකය හෝ අනුමාන වයස් සහතිකය හෝ ලබාගෙන එළඹී නිගමනයෙහි නිරවද්‍යතාව සොයා බැලිය යුතුය.

04. එසේතකුදුවුවත්, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගෙවීමේ ප්‍රමාද වළක්වාලීමේ අදහසින් නිකුත් කර ඇති අංක වි.වැ.1394 (II වෙළුම) හා 1966.06.26 දින දරණ චක්‍රලේඛ ලිපියේ 2 වන ඡේදයෙන් සලසා ඇති විශේෂ විධිවිධාන මෙයින් අවලංගු නොකෙරේ.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

කු/27